ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය - 2019
-----------------------------------------------------------------------------------------------------

ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ 2019 ජූලි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව අතර, 2019 අප්‍රේල් 25 දින එළඹි අංක. එල් - 0124 ඒ දරණ ණය ගිවිසුමේ II බී (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව
-----------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, රාජ්‍ය ආරක්ෂක සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නායයෑම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති හා රෙගුලාසි වැඩිදියුණු කිරීම තුළින් සහ ආපදා අවම කිරීමේ භෞතික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් නායයෑම්වලින් සිදුවන අවදානම් සහ හානි අවම කිරීම, ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය, එක්සත් ජනපද ඩොලර් මිලියන 110 කට සමාන රුපියල් මිලියන 19,976 ක් වී තිබුණු අතර, එම ණය මුදලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 80 කට සමාන රුපියල් මිලියන 14,528 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර, එය 2023 ජූනි 30 දින වනවිට අවසන් කිරිමට නියමිතව ඇත.

**1.3** මතය
------

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් පිළිබඳ ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම
------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයට අදාල තථ්‍ය බැදීම් ගාස්තු, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 14,194,451 | විගණක සමඟ එකඟ වේ. | බැදීම් ගාස්තු, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2019 වර්ෂයට අදාල ප්‍රාග්ධනිත සේවා ගාස්තුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 35,163,700 | විගණක සමඟ එකඟ වේ. | ප්‍රාග්ධනිත සේවා ගාස්තුව, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | රීති සහ රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 156 (5) | මුදල් පොත පැහැදිලිව නඩත්තු කර පවත්වාගෙන ගොස් නොතිබුණි | 2019 වර්ෂය සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වා ගෙන ගොස් නොමැත. | මුදල් රෙගුලාසි වල පෙන්වා දී ඇති නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 756 | 2019 වර්ෂයට අදාළව ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා, විගණිත දිනය වූ 2021 මාර්තු 31 දින දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කරන ලද මුල් වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් පැවැත්වීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇත. 2021 වර්ෂය තුලදී භාණ්ඩ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට අප විසින් පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි වල පෙන්වා දී ඇති නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතිය වෙනුවෙන් පිළියෙල කරන ලද මූල්‍යකළමනාකරණ අත්පොතෙහි VII පරිච්ඡේදය | රේඛීය අමාත්‍යාංශය වෙත වාර්තා කරනු ලබන අභ්‍යන්තර විගණකවරයකු, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත වෙනමම පත්කර ගැනීමට කටයුතු කළයුතු වුවත් විගණිත දිනය වූ 2021 මාර්තු 31 දින දක්වාම අදාල බඳවා ගැනීම සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතිය වෙනුවෙන් අභ්‍යන්තර විගණකවරයකු පත්කර ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඉල්ලුම් කර තිබුණද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාල ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණි | අභ්‍යන්තර විගණක වරයකු බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කාර්යයන්, සංරචක හතරක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම
(ආ) ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම
(ඇ) අත්‍යාවශ්‍ය පහසුකම් සැපයීම සහ
(ඈ) උපකරණ සහ තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය

| අංකය | සංරචකය | විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | සංරචක අංක - 01 | ව්‍යාපෘතියේ සංරචක අංක -01 යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛතා වැඩබිම් 147 ක ක්ෂේත්‍ර පරීක්ෂණ . විස්තරාත්මක සැලසුම්, ඉදිකිරීම් සහ අධීක්ෂණ කළමනාකරණය සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 97ක් වෙන්කර තිබුණි. එම වැඩබිම් වලින් 27ක් ප්‍රමුඛතා පදනම යටතේ සහ ඒවායේ සිවිල් වැඩකටයුතු අනුව, කොන්ත්‍රාත් වැඩ පැකේජ 04ක් යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 15.22ක වටිනාකමකට තක්සේරු කොට 2019 වර්ෂයේදී ප්‍රදානය කිරීමට තීරණය කරන ලදි. කෙසේ වෙතත් එකදු කොන්ත්‍රාත්තුවක් හෝ සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රදානය කර නොතිබුණි. | 2019 අප්‍රේල් 21 දින ශ්‍රී ලංකාවේදී සිදුවූ බෝම්බ ප්‍රහාරය වැනි හේතුන් මත කොන්ත්‍රාත් පිරිනැමීම ප්‍රමාද වූ අතර ණය දෙන ආයතනය වෙතින් 2019 වර්ෂය වෙනුවෙන් කිසිදු අරමුදල් අවශ්‍යතාවයක් සපුරා ගෙන නොතිබුණි. | ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරමින් සහ කොන්ත්‍රාත් වැඩ නියමිත කාලය තුළදී අවසන් කිරීම තුලින් අතිරේක වියදම් මගහරවා ගැනීමට පියවර ගතයුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සංරචක අංක - 02 | මෙම සංරචකය යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 1.5ක වටිනාකමකට උපදේශන සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා 2019 සැප්තැම්බර් මාසය තුලදී දැන්වීම් පළකිරීම ට අවශ්‍යතාවයක් ඇති වී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුලදී උක්ත දැන්වීම් පළකර නොතිබුණි | සංරචක අංක 02 යටතේ, ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ආයතනික ධාරිතාව වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුවේ. මෙම සංරචකය යටතේ විවිධ රාජ්‍ය ආයතන සහ ප්‍රජාව ගෙන් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වේ. 2009 අප්‍රේල් 21 දින සිදුවූ බෝම්බ ප්‍රහාරය හේතුවෙන් රට තුළ ඇඳිරි නීතිය පැනවීම සහ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය පැවැත්වීම හේතුවෙන් මෙම ක්‍රියාකාරකම කල් දැමීමට සිදුවිය. කෙසේ වෙතත් ව්‍යාපෘති කාලසීමාව ඇතුළත ක්‍රියාකාරකම් සියල්ලම නිම කිරීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘතියෙන් නියම කර ඇති ඉලක්කවලට අනුගත වීම සඳහා පියවර ගත යුතුය |

## 3.2 උපයෝජනය නොකළ වත්කම්

| විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|
| 2019 වසර තුළදී ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 3.10 කට සමාන රුපියල් මිලියන 541.80 ක් ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ඉන් කිසිදු මුදල් මුදල් ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර නොතිබුණි. එහි ප්‍රතිපලයක් වශයෙන් ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය සතුටුදායක නොවන මට්ටමක පැවතුණි. | 2019 අප්‍රේල් 21 දින සිදුවූ ශ්‍රී ලංකාවේ සිදුවූ බෝම්බ ප්‍රහාරය හේතුවෙන් සහ ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ කටයුතු ආදිය ප්‍රමාද වීම හේතුවෙන්, කොන්ත්‍රත් පිරිනැමීමද ප්‍රමාද වී තිබුණි. ඒ හේතුවෙන් 2019 වසර සඳහා ණයදෙන ආයතනය මගින් ලබාදුන් අරමුදල් ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවයක් ව්‍යාපෘතියට නොවීය. | ව්‍යාපෘතියෙන් නියම කර ඇති ඉලක්කවලට අනුගත වීම සඳහා පියවර ගත යුතුය |

**3.3** මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු

| අංකය | විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා අවශ්‍ය වූ තනතුරු 24 කට අදාල පුරප්පාඩු 45 ක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණ ද, තනතුරු 20 කට අදාල පුරප්පාඩු 35 ක් වෙනුවෙන් වූ බඳවා ගැනීම්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි. | තනතුරු කිහිපයක් සඳහා 2020 වර්ෂය තුළදී බඳවා ගැනීම් සිදු කර තිබුණු අතර සමහර තනතුරු සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනයේ සේවකයන් යොදවා ගෙන අර්ධකාලීන පදනම යටතේ බඳවා ගැනීම් සිදු කරන ලදී. | ව්‍යාපෘතියේ ක්‍රියාකාකාරිත්වය සුමට අන්දමින් පවත්වා ගෙන යාම සඳහා නිලධාරින්ගේ බඳවා ගැනීමේ කටයුතු චක්‍රලේඛවල නියමයන්ට අනුකූලව සිදු කළ යුතු වේ. |
| (ආ) | දැනට පවතින පුරප්පාඩු 35 කින් පුරප්පාඩු 23 ක් ම, විධායක මට්ටමේ තනතුරු 15 කට අදාළව පවතින පුරප්පාඩු බව ද නිරීක්ෂණය විය. | තනතුරු කිහිපයක් සඳහා 2020 වර්ෂය තුළදී බඳවා ගැනීම් සිදු කර තිබුණු අතර සමහර තනතුරු සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනයේ සේවකයන් යොදවා ගෙන අර්ධකාලීන පදනම යටතේ බඳවා ගැනීම් සිදු කරන ලදී. | ව්‍යාපෘතියේ ක්‍රියාකාකාරිත්වය සුමට අන්දමින් පවත්වා ගෙන යාම සඳහා නිලධාරින්ගේ බඳවා ගැනීමේ කටයුතු චක්‍රලේඛවල නියමයන්ට අනුකූලව සිදු කළ යුතු වේ. |

**3.4** මතභේදයට තුඩුදුන් කරුණු

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනය මගින් 2018 වසරේදී වැය කරන ලද රුපියල් මිලියන 54.2 ක මුදලක් රේඛීය අමාත්‍යාංශය විසින් ලබාදිය යුතු නිසි අධිකාරි බලය ලබා නොගෙන 2019 වසරේ ව්‍යාපෘතියේ වියදමක් ලෙස මාරු කර තිබුණි. ඊට අමතරව ඉහත ගණුදෙනු වලට සම්බන්ධ ගෙවීම් වවුචර් සහ වියදම් විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අරමුදල් මාරුකිරීම භාණ්ඩාගාරයේ නිසි අනුමැතිය සහිතව රේඛීය අමත්‍යාංශයේ සිට ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනය වෙත මාරු කර ඇත. | රේඛීය අමාත්‍යාංශයේ නිසි අධිකාරි බලය ලබාගත යුතුවේ. |